// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2147/43 - 2019 ඔක්තෝබර් මස 29 වැනි අඟහරුවාදා - 2019.10.29

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2005 අංක 38 දරන සංචාරක කටයුතු පනත**

26 (1) වැනි වගන්තිය යටතේ නියමය

2005 අංක 38 දරන සංචාරක කටයුතු පනතේ 26 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, සංචාරක සංවර්ධන, වනජීවී හා ක්‍රිස්තියානි ආගමික කටයුතු පිළිබඳ අමාත්‍ය ජෝන් ඇන්තනී ඉමැනුවෙල් අමරතුංග වන මම මෙම නියමය මගින් පහත උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ප්‍රදේශය ඉහත කී පනතේ කාර්ය සඳහා සංචාරක සංවර්ධන ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත්කරමි.

ජෝන් ඇන්තනී ඉමැනුවෙල් අමරතුංග,
සංචාරක සංවර්ධන, වනජීවී හා ක්‍රිස්තියානි ආගමික කටයුතු පිළිබඳ අමාත්‍ය.

2019 ඔක්තෝබර් මස 22 වැනි දින,
කොළඹ දී ය.

**උපලේඛනය**

***ඉරණවිල සංචාරක සංවර්ධන කලාපයේ දැක්වෙන මායිම්***

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, මහවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, බටහිර සහ නැගෙනහිර ඉරණවිල ග්‍රාම නිලධාරි වසම්වල පිහිටි ඉරණවිල, ගලහිටියාව සහ තොඩුවාව උතුර යන ග්‍රාමයන් ඇතුළත්, මැනුම්පතිගේ මූලික පිඹුරු පූ. 2937 හා පූ. 3021 දරන පිඹුරුවලින් පිළිවෙළින් හෙක්ටයාර් 138.125 සහ 27.913 ප්‍රමාණයක් දැක්වෙන පහත සඳහන් මායිම් තුළ පිහිටි ඉඩම.

| | | |
|---|---|---|
| *උතුරට* | : | ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසම සතු ඉරණවිල වත්ත |
| *නැගෙනහිරට* | : | ලුණුඔය සහ ගලහිටියාව ගම |
| *දකුණට* | : | තොඩුවාව උතුර |
| *බටහිරට* | : | ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව විසින් බෙදාදුන් පෞද්ගලික භුක්තිකරුවන් විසින් භුක්ති විඳින ඉඩම් |

11 - 1014